**CENTRE FOR MONITORING ELECTION VIOLENCE**
**මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය**
**தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்**
No 17A, Pedris Road, Colombo 3, Tel: **011 3010664/011 2577334**, Fax: **011 2577117**
**E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org

## වසර 2016 ට අදාළ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය පිළිබඳ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ නිවේදනය

කවර මැතිවරණ ක්‍රියාවලියක වුව ද අතිශය වැදගත් මෙන්ම තීරණාත්මක සාධකයක් වන්නේ ඡන්දහිමි නාමලේඛණයයි. එය යාවත්කාලීනව පවත්වාගැනීම සඳහා විවිධ රටවල් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබයි. මෙරටෙහි ඡන්දහිමි නාමලේඛනය වාර්ෂිකව ප්‍රතිශෝධනය කරනු ලබන අතර එකී ක්‍රියාවලිය ඇරඹෙන්නේ සෑම වසරක ම ජූනි මස 01 වැනිදායිනි. එවකට පැවති "මැතිවරණ" හා "පළාත් පාලන ඡන්ද විමසීම්" යන දෙපාර්තමේන්තු දෙක ඒකාබද්ධ කරමින් මෙරටේ මැතිවරණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලද්දේ මීට වසර 61 කට පමණ පෙරදී එනම් වර්ෂ 1955 ඔක්තෝම්බර් මස 01 දිනයි. මැතිවරණ කොමිෂන් සභාව අභිනවයෙන් ස්ථාපිත කරන ලද්දේ වසර 2015 නොවැම්බර් මස 13 වැනි දිනයි. එතැන් පටන් මෙරටේ ක්‍රියාත්මක වන්නේ මැතිවරණ කොමිෂන් සභාව වන අතර මෙවර ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයේ සුවිශේෂත්වය වන්නේ එලෙස ස්ථාපිත කරන ලද මැතිවරණ කොමිෂන් සභාව යටතේ ප්‍රතිශෝධනයට ලක්වන පළමු ඡන්දහිමි නාමලේඛනය මෙය වීමයි.

ඒ අනුව මාස 03 ක් හා දින 27 ක කාලයක් පුරා දිවයින සිසාරා පිහිටි ග්‍රාම සේවා වසම් 14022 ක් ආවරණය වන පරිදි ග්‍රාම නිලධාරීවරුන් 12607 ක පමණ පිරිසක් සහභාගීකර ගනිමින් හා කොළඹ මහා නගර සභා සීමාව ආවරණය වන පරිදි පත් කරන ලද "විශේෂ ගණන් ගන්නා නිලධාරීන්ගෙන්" සැදුම්ලත් සුවිශාල මිනිස් ශ්‍රම බලකායකගේ සහාය ලබාගනිමින් අවසන් කරන ලද වසර 2016 ට අදාළ ඡන්දහිමි නාම ලේඛනයේ යාවත්කාලීන කිරීමේ කටයුතු මෙදිනෙන් එනම් වසර 2016 සැප්තැම්බර් මස 28 වැනිදායින් සමාප්ත වීමට නියමිතය. ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභා මහලේකම් කාර්යාලය, දිවයිනේ පරිපාලන දිස්ත්‍රික්ක 25 ක පිහිටි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල සේවය මෙන්ම අනෙකුත් රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන්හි සේවය ද නිසි සම්බන්ධීකාරකත්වයකින් යුක්තව ලබා ගැනීමට සමත් විය. වෙනත් වර්ෂ වලදී අනුදත් ක්‍රමවේදය ම මෙවරත් අනුගමනය කළ ද එකී සමස්ත ක්‍රියාවලිය පුරා දක්නට ලැබුණු සුවිශේෂතා කිහිපයක් විය. ඉන් වඩාත් කැපී පෙනෙන ලක්ෂණය වුයේ මහමැදුරේ සිට පැල්පත දක්වාත් ,වීදියේ සිට ආබාධ සහිතව දිවිගෙවන පුද්ගලයන්ගෙන් සමන්විත ජන කණ්ඩායම් දක්වාත් පුළුල් පරාසයක විහිද දිවි ගෙවන සියලු සුදුසුකම් ලත් ශ්‍රී ලාංකේය පුරවැසියන් ඡන්දහිමියන් ලෙස ලියාපදිංචි කරගැනීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව ගන්නා ලද ප්‍රායෝගික උත්සාහයයි. ඉනිදු නොනැවතී එය වඩාත් නිර්මාණශීලී වැයමක් කරනු වස් # youth Vote SL.නමින් වූ සමාජ ජාලා මාධ්‍ය කේන්ද්‍ර කරගත් ප්‍රචාරක ව්‍යාපාරයක් ද දියත් කරන ලදි. එමෙන්ම පුරවැසියන් දැනුවත් කිරීමෙහිලා මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සමග එක්ව නිර්මාණය කරන ලද ප්‍රචාරක වැඩසටහන් ආදිය පවා නිෂ්පාදනයේ දී ශ්‍රවනාබාධිත පුද්ගලයන් දැනුම්වත් කිරීම සඳහා සංඥා භාෂාව ද (Sign Language) උපයෝගී කරගන්නා ලදි. (https://cmev.org/2016/07/14/cmev-enumeration-process-2016/). ඊට අමතරව පැෆ්රල්, මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) හා කැෆේ ප්‍රමුඛ අනෙකුත් මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා ඒකාබද්ධව සමස්ත දිවයින ම ආවරණය වන පරිදි පුරවැසියන් දැනුම්වත් කිරීම සඳහා සංවිධානය කරනු ලැබූ දැනුම්වත් කිරීමේ සැසි පැවැත්වීමේ උත්සාහයට ද මෙවරත් වැඩි ප්‍රමුඛතාවක් දෙනු ලැබීය. ඡන්ද හිමි නාමලේඛන වාර්ෂිකව ප්‍රතිශෝධන කිරීම මැතිවරණ කොමිෂන් සභාව නිතැතින්ම ඉටු කළ යුතු මූලික කාර්යයක් වුව ද මැ.ප්‍ර.නි.ම. ඒ

පිළිබඳ සුවිශේෂී අවධානයක් මෙලෙස යොමු කිරීමට හේතු වූයේ කරුණු කිහිපයක් පදනම් කර ගනිමිනි. එහිලා අදාළ මූලික ම කරුණ නම් මෙවැනි ක්‍රියාවලියක් අභියස කොන්දේසි විරහිතව සහාය දිය යුතු ලියාපදිංචි දේශපාලන පක්ෂ බොහෝමයක් ඊට අදාළ නිසි සහාය ලබා නොදෙමින් කටයුතු කිරීම හා මැතිවරණ පමණක් ඉලක්ක කර ගනිමින් ක්‍රියාකාරී වීමයි. දෙවැනි කරුණ වන්නේ කවර උත්සාහයන් ගත්ත ද තම නම වාර්ෂික ඡන්දහිමි නාම ලේඛනයට ඇතුළත් කරගැනීමට තරම් සංවිඥාඥානකත්වයක් බොහෝ පුරවැසියන් සතුව නොතිබීමයි. එය තම පුරවැසි වගකීම පැහැර හරිනු ලබන ක්‍රියාවක් යැයි බොහෝ පුරවැසියන් මෙතෙක් වටහා නොගෙන සිටීම ඉතා කණගාටුදායක තත්ත්වයකි. ඊට අමතරව මෙරටේ බොහෝ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන පෙන්වා දී ඇති පරිදි ඡන්දහිමියන් ලියාපදිංචි කිරීම සඳහා දැනට යොදාගන්නා ක්‍රමවේදය වහා සංශෝධනය කිරීමට අදාළ දේශපාලන පක්ෂ නායකයින් මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ද පෙරට ආ යුතු කාලය එළඹ ඇත.

ඡන්දහිමියන් ලියාපදිංචි කිරීම සහ ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය වාර්ෂිකව සිදු කරනු ලබන්නේ මූලිකව ම 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේය. එනමුත් වෙනත් රටවල් වර්තමානය වන විට ඡන්දහිමියන් ලියාපදිංචිය හා අදාළ ලේඛන ප්‍රතිශෝධනය සඳහා යොදාගනු ලබන ක්‍රමවේද පිළිබඳව සළකා බැලීමේදී මෙරටේ අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගය අධික පිරිවැයක් හා සුවිශාල මිනිස් ශ්‍රමයක් අවශ්‍ය වන්නා වූ ක්‍රමවේදයකි. එකී ක්‍රියාදාමය සඳහා දායක වන ග්‍රාම නිලධාරීන්ගේ ක්‍රියා කලාපය පිළිබඳව ද ඉදිරිපත්වෙමින් තිබෙන මැසිවිලි ප්‍රමාණය අධිකය. බහුතරයක් ග්‍රාම නිලධාරීවරුන් අදාළ කර්තව්‍යය තම ප්‍රමුඛ කාර්යයක් සේ ඉටු කළ ද ඔවුන්ගෙන් ඉතා සුළුතරයක් එකී කාර්යය සඳහා නිසි අවධානය හා ප්‍රමුඛත්වය නොදීම ඉතා බරපතල ගැටළුවකි. මෙකී සියලු කරුණු සළකා බැලීමේ දී පැහැදිලිවන්නේ නවීන තාක්ෂණය ද මුසුකර ගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගත "විවෘත ඡන්දහිමි නාමලේඛන" (Open Register) වැනි ක්‍රමවේදයක් හෝ ඊට සමගාමී වෙනත් ක්‍රමවේදයක් පිළිබඳව සළකා බැලීම කාලීන අවශ්‍යතාවක් බවයි. මෙය සමස්ත මැතිවරණ කොමිෂන් සභාව ම, සෑම වසරක් පාසා තෙමසකට ආසන්න කාලයක් තිස්සේ සිදු කරනු ලබන ඉතා වෙහෙසකර මෙන්ම වැඩි මිනිස් ශ්‍රමයක් වැයකරනු ලබන ආයාසකර ක්‍රියාවලියක් බැවින් එය කාලීන පරිසරයට උචිත ආකාරයෙන් නව තාක්ෂණික මෙවලම් ද භාවිතා කරමින් සිදුකළ යුතු කාර්යයක්ය යන්න අවිවාදිත කරුණකි. ඒ සඳහා දැනට බලපැවැත්වෙන 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනයට ලක්විය යුතු අතර ම ඊට ප්‍රථම සිදුකළ යුතු මූලික කාර්යයක් වන්නේ කවර ක්‍රමයක් මෙරටට වඩාත් ගැළපෙන්නේ ද යන්න පිළිබඳ සංවාදයක් ඇරඹීමයි. එවන් පුරෝගාමී කාර්යභාරයක් සඳහා මෙරටේ සියලු දේශපාලන පක්ෂ හා ඒවායේ නායකයන් සතුව නිසි දේශපාලන අධිෂ්ඨානයක් පැවතිය යුතු අතර එමෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මැදිහත්වීම ද මෙහිලා ඉතා තීරණාත්මකය. කිසිදු ඡන්දදායකයෙක් අත් නොහැරෙන මැතිවරණ ක්‍රියාවලියක් (The electoral process where no elector is to be left behind) යන තේමාව යටතේ සියලු දෙනා ඇතුළත් කරගන්නා සුළු (Inclusive Electoral Process) මැතිවරණ ක්‍රියාවලියක් සහතික කරනු වස් මැතිවරණ කොමිෂන් සභාව ගනු ලබන මෙවන් ප්‍රෝත්සාහී ක්‍රියාමාර්ග මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ නොමඳ ඇගයීමට ලක් වේ. තවද කොමිෂන් සභාවේ මෙවන් ක්‍රියාමාර්ග වඩාත් ජනතාවාදී මෙන්ම ප්‍රතිඵලදායී කරනු වස් ඊට අදාළ නිසි සහාය සියලු දේශපාලන පක්ෂ විසින් ලබාදෙනු ඇතැයි යන්න අපගේ විශ්වාසයයි.